2016

වෙළුම 40

දෙවැනි කලාපය

ISSN 1991-040 X

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

# ගොවිකටයුතු

## පුවත් හසුන




## කෘෂිකාර්මික තිරසාරභාවය ඇගයීම සඳහා වූ තෙදින වැඩමුළුව



'ශ්‍රී ලංකාවේ ගෝලීය විචලතා හමුවේ තිරසාරභාවය සඳහා කෘෂි පර්යේෂණ-ප්‍රතිපත්ති-තාක්ෂණික ක්ෂේත්‍රයන්හි ධාරිතා සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘතිය' යටතේ සංවිධානය කරනු ලැබූ කෘෂිකාර්මික තිරසාරභාවය ඇගයීම සඳහා වූ වැඩමුළුව 2016 අගෝස්තු මස 3,4 සහ 5 යන දිනයන්හි හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දී පැවැත්විණි.

එම වැඩමුළුව ආයතනයේ කෘෂි සම්පත් කළමනාකරණ අංශය විසින් සංවිධානය කළ අතර ඒ සඳහා මූල්‍ය අනුග්‍රාහකත්වය දරන ලද්දේ 'ගෝලීය විචලතා පර්යේෂණ සඳහා වූ ආසියා පැසිපික් ජාලය' (Asia Pacific Network for Global Change Research) විසිනි. එම ආයතනයට අදාළ දේශීය නියෝජිතයින් වශයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් ලලිත් චන්ද්‍රපාල සහ තාක්ෂණික ක්‍රියාකාරී කමිටුවේ අනුර ජයතිලක යන මහත්වරු මෙම සමුළුවට සහභාගී වූහ.

පර්යේෂණ ප්‍රතිපත්ති සහ තාක්ෂණික යන අංශයන්හි ක්‍රියාකාරී ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලයේ ගෝලීය විචලතා සහ තිරසාරභාවය පිළිබඳ ධාරිතා සංවර්ධනය කිරීම වැඩමුළුව සංවිධානය කිරීමේ අරමුණයි.

තිරසාරභාවය නමැති සංකල්පය හඳුනා ගැනීම, කෘෂිකාර්මික තිරසාරභාවය වෙනුවෙන් කෘෂිකාර්මික ප්‍රතිපත්තිවල දායකත්වය කෙබඳු ද යන්න මෙන්ම ඒ සඳහා වන විවිධ ප්‍රවේශයන් පිළිබඳ පුළුල් සංවාදයක් තෙදින වැඩමුළුව පුරා ගොඩ නැගුණි.

වැඩමුළුව සඳහා බාහිර සම්පත් දායකයින් ලෙස ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සභාපති ආචාර්ය ජේ.ඩී.එච්. විජේවර්ධන මහතා, ශ්‍රී ලංකා ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වන හා පරිසරික විද්‍යා දෙපාර්තමේන්තුවේ ආචාර්ය ප්‍රසාන්ති ගුණවර්ධන මිය, කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවේ ආචාර්ය පී.එම්. දූනුසිංහ මහතා, වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ ආචාර්ය ජගත් එදිරිසිංහ මහතා, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ පීඨාධිපති ආචාර්ය ඩී.පී.එස්. චන්ද්‍රකුමාර මහතා, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකාර්මික ආර්ථික විද්‍යා සහ ව්‍යාපාර කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ආචාර්ය පරාක්‍රම වැලිගමගේ යන මහත්ම මහත්මීහු සහභාගී වූහ.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය වෙනුවෙන් වැඩසටහනේ සංවිධාන කටයුතු හා සම්බන්ධීකරණ කටයුතු සිදුකරනු ලැබුවේ ව්‍යාපෘති නායක පී.ආර්. වීරක්කොඩි, සහය අධි පර්යේෂක ශ්‍යාමිණී කේ. කුමාර, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් වන එස්. ඇපාසිංහ සහ සුසිලා ලූර්දු, පර්යේෂණ නිලධාරින් වන ප්‍රසන්න විජේසිංහ, චින්තක ජයසූරිය, රසිකා විජේසිංහ යන මහත්ම මහත්මීහු වෙති.



# පහතරට තෙත් කලාපයේ කුඹුරු බිම් වී වගාව සඳහා ශක්‍යතාවය අනුව වර්ගීකරණය කිරීම

**ශ්‍රී ලංකාවේ** පහතරට තෙත් කලාපයේ කුඹුරු විවිධ හේතු නිසා පුරන්වීම සහ වෙනත් පරිහරණයන්ට යොදා ගැනීම සුලභව දක්නට ලැබේ. මේ සඳහා සමාජ ආර්ථික හේතු මෙන්ම භූමියේ ඇති සීමාකාරී සාධක ද බලපා ඇත. කුඹුරු පුරන්වීමට බලපාන සීමාකාරී සාධක හා සමාජ ආර්ථික සාධක හඳුනා ගැනීමත්, එම සීමාකාරී සාධක පදනම් කර කුඹුරු වර්ගීකරණය කළ හැකි ක්‍රමවේදයක් සකස් කිරීමත්, එය භාවිතා කර තෝරාගත් කුඹුරු වර්ගීකරණය කිරීමත් මෙම අධ්‍යයනයේ අරමුණු විය.

අප ආයතනයේ පර්යේෂණ නිලධාරී ප්‍රසන්න විජේසිංහ මහතාගේ සම්බන්ධීකරණයෙන් සහ ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (කෘෂි ආර්ථික විද්‍යා) එච්.එම්. සිසිර හපුආරච්චි මහතාගේ සම පර්යේෂකත්වයෙන් අධ්‍යයන සිදු කෙරිණි.

මෙම අධ්‍යයනය මඟින් සීමාකාරී සාධකවල ප්‍රබලතාවය අනුව පළමු පන්තියේ සිට සිව්වැනි පන්තිය දක්වා ගමන් කිරීමේ දී වී වගාව සඳහා ශක්‍යතාවය අඩුවන ආකාරයට කුඹුරු බිම් පන්තීන් හතරකට වර්ගීකරණය කෙරේ. වී වගාවට වඩාත් යෝග්‍ය පළමු හා දෙවන පන්තීන්වලට අයත් කුඹුරුවලින් 44%ක් හා 64%ක් වගා නොකිරීම මඟින් භෞතික සාධකවලට වඩා සමාජ, ආර්ථික සාධක කුඹුරු වගා නොකිරීමට ප්‍රබල ලෙස බලපා ඇති බව තහවුරු වෙයි. ඒ අතරින් පවුලේ ශ්‍රමය හා කුලී ශ්‍රමය සපයා ගැනීම ප්‍රධාන ගැටලුව වී ඇත. වී වගාව සඳහා තරුණ සහභාගීත්වය අඩු වීම හා වගා නොකරන කුඹුරුවලින් බහුතරයක් කිසිදු ආර්ථික කටයුත්තක් සඳහා යොදවා නොමැති වීමත් තුළින් මෙම කලාපයේ භූමි සම්පත ඌන උපයෝජනය වී තිබේ.

මෙම අධ්‍යයනය තුළින් කරන ලද කුඹුරු බිම් ශක්‍යතා වර්ගීකරණය ඉතා සරල පහසුවෙන් භාවිතා කළ හැකි ක්‍රමවේදයක් වීම නිසා කුඹුරු ඉඩම් භාවිතය හා කළමනාකරණය වැඩි දියුණු කිරීමට දායක වන ප්‍රතිපත්ති සම්පාදනයට හා සංවර්ධන ක්‍රියාදාමයන්ට අවශ්‍ය මඟ පෙන්වීම මෙමඟින් ලබාදෙයි.

# දුම්කොළ වගාවේ වර්තමාන තත්ත්වය රාජ්‍ය ප්‍රතිපත්තිය සහ විකල්ප කෘෂි බෝග සඳහා ගොවීන් යොමු කිරීමේ ශක්‍යතාවය පිළිබඳ අධ්‍යයනය

**ශ්‍රී ලංකාවේ** දුම්කොළ වගාව සීමා කිරීමට රජය තීරණයකට එළඹීමේ සූදානමක් පවතින අවස්ථාවක දුම්කොළ වගාවේ වර්තමාන තත්ත්වය හා රජයේ ප්‍රතිපත්තිය පිළිබඳව ජනතාවගේ අදහස් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් මාතලේ, පුත්තලම, කුරුණෑගල, සහ යාපනය දිස්ත්‍රික්ක ආශ්‍රිතව මෙම අධ්‍යයනය අධ්‍යයනය සිදු කරන ලදී. කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති ඇගයීම් අංශයේ අධි පර්යේෂක ආචාර්ය ටී.ඒ. ධර්මරත්න සහ එම අංශයේ සහය අධි පර්යේෂක ආර්.එල්.එන් ජයතිස්ස යන මහත්වරු විසින් මෙම අධ්‍යයනය සිදු කරනු ලැබුණි.

ශ්‍රී ලංකාවේ උතුරු මැද, වයඹ සහ මධ්‍යම පළාත්වල වියළි කලාපීය ගොඩ ඉඩම්වල හා යල කන්නයේ කුඹුරු ඉඩම්වල දුම්කොළ වගාව සිදු කරන අතර දුම්කොළ සමාගම මඟින් නිෂ්පාදන මිල දී ගැනීම නිසා වෙළඳපොළ සුරක්ෂිතතාවය තහවුරු වී තිබේ. තත්ත්වයෙන් උසස්, ඉහළ ශ්‍රේණිවලට අයත්, ඉහළ ප්‍රමිතියෙන් යුත් දුම්කොළ නිෂ්පාදනය කර ඉහළ මිල ගණන් යටතේ අලෙවි කිරීමට අවශ්‍ය තාක්ෂණය භාවිතා කිරීම සඳහා අවශ්‍ය උදුන් ඉදි කර දුම්කොළ වගාවේ නිරත වීම වගා ප්‍රදේශවල සුලභ දසුනකි.

එසේ නමුත් මිනිස් ශරීරයට හානිකර වගාවක් වශයෙන් හඳුනා ගැනීම හා ඒ සම්බන්ධයෙන් දියත් වූ පුළුල් ප්‍රචාරය හේතුවෙන් එම වගාවේ යම් පසුබෑමක් දක්නට ලැබේ. එබැවින් දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන පරිහරණය කිරීමට එරෙහිව ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ පසුබිමක් නිර්මාණය වී තිබේ. දුම්කොළ වගාවට විකල්පයක් ලෙස අතිරේක බෝග වගාවට ගොවීන් යොමු කිරීම සඳහා රජය ප්‍රමුඛත්වය ලබා දීමට අපේක්ෂා කරනු ලැබුව ද දුම්කොළ වගාවෙන් බොහෝ ප්‍රතිලාභ ලබන ගොවි ජනතාව එම යෝජනාවට වැඩි කැමැත්තක් නොදක්වති.

විශේෂයෙන් දුම්කොළ වගාව යාපනය ගොවි ජනතාවගේ සමාජ, සංස්කෘතික ජීවිතය හා බැඳී පවතී. ඔවුහු සුරුට්ටු නිපදවීමට හා බුලත්විට සමඟ පරිභෝජනයට ගැනීම පිණිස දුම්කොළ වගා කරති. අක්කර කාලක වගාවක් සඳහා රු.50,000 ත් රු.70,000ත් අතර පිරිවැයක් දරන අතර ඉන් ලබන ලාභය රු.20,000ත් රු.30,000ත් අතර වේ. වැඩි වියදමක් දරා දුම්කොළ උදුන් ගොඩ නගාගෙන තිබීම, අනෙකුත් බෝගවලට සාපේක්ෂව දුම්කොළවලට වැඩි ස්ථාවර මිලක් පැවතීම, දුම්කොළ පානය සිරුරට අහිතකර යැයි යාපනයේ ගොවීන් විශ්වාස නොකිරීම, දුම්කොළ සමාගම් විසින් දෙන සහයෝගය වැනි හේතු මත ගොවීහු දුම්කොළ වගාවෙන් ඉවත් නොවී සිටිති.

ගොවීන් දුම්කොළ වගාවෙන් ඉවත් වුවහොත් දේශීය අවශ්‍යතා සඳහා ආනයනය කළ යුතු වේ. ඊට විදේශ විනිමය වැය වේ. තවද දුම්කොළ වගාව බොහෝ ඉදිරිපස හා පසුපස බැඳීම් රාශියක් ඇති ක්‍රියාවලියක් බැවින් ආර්ථිකය අසමාන වී රැකියා හා ජීවන මාර්ග නොමැති වී ජන ජීවිතය අපහසුතාවයට පත් වන බැවින් යෝජිත රාජ්‍ය ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් නැවත සලකා බැලිය යුතුව තිබේ.





# නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්කයේ සුළු හා මධ්‍ය පරිමාණ මල් වගාකරුවන්ගේ වර්තමාන තත්ත්වය සහ සංවර්ධන විභවතා

**වර්තමානයේ** මල් වගාව හා ඒ ආශ්‍රිත කර්මාන්තයේ පවතින ආකර්ෂණීයභාවය නිසා රැකියා විරහිත තරුණ ප්‍රජාවත්, ග්‍රාමීය මට්ටමේ සුලභව පවතින කාන්තා ශ්‍රමයත් කර්මාන්තය වෙත යොමු කර ගැනීමේ හැකියාව ඉහළ මට්ටමක පවතී.

එබැවින් මල් වගාව සඳහා පාරිසරික වශයෙන් ඉහළ විභවයක් පවතී. නුවරඑළිය හා බදුල්ල යන දිස්ත්‍රික්කයන්හි සුළු හා මධ්‍ය පරිමාණ මල් වගාකරුවන් මුහුණ දෙන ගැටලු හා සීමාවන් අධ්‍යයනය කරමින් එම දිස්ත්‍රික්කයන්හි මල් කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා සුදුසු යෝජනා ඉදිරිපත් කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අපේක්ෂාව වේ.

අධ්‍යයනයේ විශේෂිත අරමුණු අතර නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්කයේ සුළු හා මධ්‍ය පරිමාණ මල් වගා කරුවන්ගේ සමාජ ආර්ථික තත්ත්වය විමර්ශනය කිරීම, ප්‍රදේශයට අදාළව මල් වගාවේ ස්වභාවය, නිෂ්පාදනය හා අලෙවි රටාව අධ්‍යයනය කිරීම, වගාකරුවන් මුහුණ දෙන ගැටලු හා සීමාවන් හඳුනා ගැනීම හා ප්‍රදේශය තුළ මල් කර්මාන්තය දියුණු කිරීම සඳහා මල් වගාකරුවන්ගේ අදහස් හා යෝජනා විමසා බැලීම කැපී පෙනේ.

බදුල්ල සහ නුවරඑළිය දිස්ත්‍රික්කයන්හි මල් වගාකරුවන් පිළිබඳ නියැදි සමීක්ෂණයක් ඇසුරින් සිදු කළ මෙම අධ්‍යයනයේ අවසන් වාර්තාව 2017 මැයි මස අගභාගයේ දී පත් වීමට නියමිතය.

# ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන ආශ්‍රිත පාදක සමීක්ෂණය

**දේශීයව** නිෂ්පාදනය කළ හැකි ආහාර වර්ග ගුණාත්මකව නිෂ්පාදනය කර එකී ආහාර නිෂ්පාදනය අතින් ස්වයංපෝෂණය වීම සඳහා තබා ඇති ඉලක්ක කරා ගමන් කිරීම හා එමගින් රට තුළ විශාල විදේශ විනිමයක් ඉතිරි කර ගැනීම සඳහා අවශ්‍ය වන උපාය මාර්ග හා ඊට අදාළ ක්‍රියාකාරකම් අන්තර්ගත වන පරිදි විෂය භාර අමාත්‍යාංශ හා අනුබද්ධ අනෙකුත් ආයතන ඒකාබද්ධ කර ගනිමින් ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන 2016-2018 රට තුළ ක්‍රියාත්මක කිරීමට රජය සැලසුම් කර තිබේ.

වසර තුනක ඉලක්ක කාලයක් ඇතුළත සිදු කෙරෙන මෙම වැඩසටහනෙහි සාර්ථකත්වය අවුරුදු පතා මැන බැලීමේ දී යොමු සලකුණක් ලෙස ඉවහල් කර ගත හැකි වන පරිදි පූර්ව තක්සේරු සමීක්ෂණයක් සිදු කිරීමේ කාර්යභාරය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය වෙත පැවරී තිබේ.

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන ක්‍රියාත්මක වන ප්‍රදේශයන්හි වගා කටයුතු සම්බන්ධයෙන් පවත්නා තත්ත්වය



පිළිබඳව සංඛ්‍යාත්මක හා ගුණාත්මක දත්ත රැස් කිරීම සහ මෙම ව්‍යාපෘතියේ බලපෑම් පිළිබඳ ප්‍රගති සමාලෝචනය කිරීම සඳහා එම දත්ත ආශ්‍රයෙන් ගොඩ නගනු ලබන දර්ශක භාවිතා කිරීමයි.

දිවයිනේ සියලුම පළාත් ආවරණය වන ආකාරයට ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ දිස්ත්‍රික්ක 20ක මුළු කෘෂිකාර්මික ජනගහනය හා එක් එක් බෝගය යටතේ ඇති කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණය සැලකිල්ලට ගෙන තෝරාගත් ගොවීන් 2500ක් ඇතුළත් නියැදියකින් දත්ත රැස් කරන ලදී.



ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනේ ප්‍රමුඛතාවය ලබා දී ඇති බෝග කාණ්ඩ 16ක් සම්බන්ධයෙන් 2016 යල කන්නය ආරම්භ වීමට ප්‍රථම මෙම සමීක්ෂණය අවසන් කරන ලදී.

මෙම සමීක්ෂණයේ සම්බන්ධීකරණ කටයුතු ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී සිදත් බණ්ඩාර මහතා විසින් සිදුකරන ලද අතර පර්යේෂණ නිලධාරීන් විශාල පිරිසකගේ දායකත්වය මේ සඳහා ලැබිණි.



# ගොවි සංවිධාන සවිබල ගැන්වීමේ පුහුණු වැඩසටහන

**ගොවි** සංවිධාන මෙරට කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ සංවර්ධනය ට සෘජුව ම දායක වන ගොවි ජනතාවගේ සාමුහික යහපත හා සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක වන පුළුල් නෛතික පදනමකින් යුක්ත ග්‍රාමීය සංවිධානයකි. ගොවි සංවිධාන නායකයන් ගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම තුළින් ගොවි සංවිධාන ශක්තිමත් කිරීම හා ගොවීන් කෘෂිකාර්මික සංවර්ධන ක්‍රියාවලියේ සක්‍රීය කොටස් කරුවන් බවට පත් කිරීමේ අරමුණින් මේ පුහුණු වැඩසටහන නිර්මාණය කරන ලදී.



පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන 18කට අයත් ගොවි සංවිධානවල නායකයින් මෙම පුහුණු වැඩසටහනෙහි පුහුණුලාභීහු වූහ. 2016 අගෝස්තු මස 09 වන දින සිට සැප්තැම්බර් මස 08 දින දක්වා පැවති එක් දින පුහුණු වැඩසටහන් 15ක් තුළින් ගොවි සංවිධාන නිලධාරීන් 1400කට පමණ පුහුණුව ලබාදීමට හැකිවිය.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශයේ අංශ ප්‍රධාන එස්.එම්.ඒ. සමරකෝන් මහතා මෙම පුහුණු වැඩසටහන සම්බන්ධීකරණය කරන ලද අතර ජ්‍යොෂ්ඨ පර්යේෂණ නිලධාරීන් වන පී.සී.ජේ. ද සිල්වා සහ එච්.එම්.ජේ.කේ. හේරත් යන මහත්වරුන් හා පුත්තලම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීහු ද සම්පත් දායකයින් ලෙස කටයුතු කළහ.

# කෘෂි ව්‍යාපාර සංකල්ප භාවිතය සහ අලෙවි ව්‍යාප්ති සේවය පිළිබඳ දෙදින වැඩමුළුව

යාපනය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ සිසුන් සඳහා සංවිධානය කළ ඉහත වැඩමුළුව 2016 දෙසැම්බර් 08 – 10 දක්වා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දී පැවැත්විණි.

කෘෂි ව්‍යාපාර හා ව්‍යාපාර ගිණුම්කරණය ප්‍රධාන විෂය ලෙස හදාරන සිසුන් ඉලක්ක කරගෙන පැවති මෙම වැඩමුළුවේ ප්‍රධාන අරමුණ වූයේ මෙම ආයතනයේ කෘෂිකාර්මික අලෙවිකරණ තොරතුරු පද්ධතිය පිළිබඳ ප්‍රායෝගික දැනුමක් හා අත්දැකීමක් සිසුන්ට ලබා දීමයි. එසේම, හෙ.කො.ගො.ප.පු. ආයතනයේ පර්යේෂණ හා ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් පිළිබඳ අත්දැකීම් හුවමාරු කර ගැනීම හා උගත් පාඩම් පිළිබඳ දැනුවත් කිරීම අනෙකුත් අරමුණු අතර විය.

මෙම වැඩමුළුව සඳහා කෘෂිකර්ම පීඨයේ සිසුන් හා ආචාර්ය මණ්ඩලය ඇතුළු පිරිසක් සහභාගී වූ අතර 'දියත උයන' සුළු පරිමාණ නිෂ්පාදකයින්ගේ විශේෂ වෙළෙඳපොළ හා පිටකොටුව මැනිං වෙළෙඳපොළ ඇතුළු ප්‍රධාන වෙළෙඳ කේන්ද්‍රස්ථාන කිහිපයක නිරීක්ෂණ චාරිකාවන්ට සම්බන්ධ වීමට ද ඔවුන්ට අවස්ථාව උදාවිය.

දුමින්ද ප්‍රියදර්ශන, එස්.එම්.ඒ. සමරකෝන්, ඩබ්.එච්.ඒ. ශාන්ත, පී.සී.ජේ. ද සිල්වා, එච්.ජේ.සී. ජයසූරිය, අයි.පී.පී. එම් විජේසිංහ, ඩබ්.ඒ.එන්. විජේසූරිය යන පර්යේෂණ නිලධාරීහු මෙහි සම්පත් දායකත්වයෙන් හා සංවිධාන කටයුතු සිදු කිරීමෙන් සහය වූහ.

මෙහි සඳහන් පර්යේෂණ පිළිබඳ ඔබට කිසියම් තොරතුරක් දැන ගැනීමට ඇතොත් හෝ ඒ සම්බන්ධ වැඩි දුර විස්තර දැනගැනීම සඳහා අප ආයතනයේ දුරකථන අංක 011-2698539-41 හෝ 011-7417100-5 අමතා එම පර්යේෂණ නිලධාරීන් සම්බන්ධ කර ගැනීමට ඔබට හැකිය.

ගොවි කටයුතු පුවත් හසුන හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රවෘත්ති හා ප්‍රකාශන ඒකකය මගින් පළ කෙරෙන ත්‍රෛමාසික ප්‍රකාශනයකි. ආයතනය මගින් සිදු කෙරෙන පර්යේෂණ හා අනෙකුත් ශාස්ත්‍රීය වැඩසටහන් තුළින් ජනනය කරනු ලබන නව දැනුම මේ මගින් ප්‍රකාශයට පත් කෙරේ.


ලබාගත් මූලය සඳහන් කරමින් මෙහි ඇති කරුණු උපුටා ගත හැකිය

සම්පාදනය

වසන්ති රාජපක්ෂ

පරිගණක මෙහෙයුම්

ඒ.පී. උදේනි කරුණාරත්න



# 'ශ්‍රී ලාංකීය කෘෂිකර්මයේ ගමන්මඟ' විද්වත් දේශනය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 44වන සංවත්සරය වෙනුවෙන් විද්වත් දේශනයක් මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය විසින් සංවිධානය කරනු ලැබිණ. "ශ්‍රී ලාංකීය කෘෂිකර්මයේ ගමන් මඟ" මැයෙන් වූ එම දේශනය පවත්වනු ලැබුවේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පූජ්‍ය අතුරලියේ රතන හිමියන් විසිනි.

වඩාත් ජනතා හිතවාදී වස විසෙන් තොර කෘෂිකර්මාන්තයක් සඳහා යා යුතු මාවත පිළිබඳ වටිනා අදහස් මාලාවක් දේශනය තුළ අඩංගු වී තිබුණි.

## නව ප්‍රකාශන

එළවළු අපනයනය ආශ්‍රිත සැපයුම්දාම විශ්ලේෂණය

නිල්වලා ව්‍යාපාරයට අයත් ප්‍රදේශවල වගා නොකරන ඉඩම් ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා ඵලදායීව භාවිතයට ගැනීම

කිරි හා කොරටු වගාවන් ආශ්‍රිත නිෂ්පාදන හා අලෙවිකරණය පිළිබඳ අධ්‍යයනය - මාතර දිස්ත්‍රික්කය

දුම්කොළ වගාවේ වර්තමාන තත්ත්වය, රාජ්‍ය ප්‍රතිපත්තිය සහ විකල්ප කෘෂි බෝග සඳහා ගොවීන් යොමු කිරීමේ ශක්‍යතාවය පිළිබඳ අධ්‍යයනය

ග්‍රාමීය කාන්තා ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය සඳහා කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන්හි දායකත්වය හා වැඩි දියුණු කිරීමේ අවස්ථා

සමාජ සජීවිකරණය (පළමුවෙනි වෙළුම)

Application of Integrated Pest Management (IPM) in Vegetable Cultivation: Past Experiences and Suggestions for Promotion

Comparative Study on Consumer Preferences of Fruit Drinks and Carbonated Drinks in Sri Lankan Beverage Market


Socio Economic Factors Affecting the Productivity of Green Gram


Agricultural Forward Contract as Pre-Harvest Commodity Marketing: Problems and Prospects


Viability of Controlled Environmental Agriculture for Vegetable Farmers in Sri Lanka


Socio Economic Condition of Dairy Industry in Mahaweli H Area


Impact and Lessons of Uda Walawe Left Bank Irrigation Upgrading and Extension Project for Water Resources Management










# ගොවිකටයුතු පුවත් හසුන

අධ්‍යක්ෂ
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114 විජේරාම මාවත, කොළඹ 07